# 7 ශ්‍රේණිය – සිංහල
# 20 පාඩම සකස් කඩ නොකී කට

- කියවීම ආකාර කිහිපයකි.
- නිහඬව කියවීම : වචන කියවීම/ වචන ගළපා වාක්‍ය කියවීම/ අර්ථ අවබෝධයෙන් වාක්‍ය කියවීම/ ඡේදයක සමස්ත අවබෝධය සඳහා කියවීම.
- හඬ නගා කියවීම : ශබ්ද නගා කියවීම/ නිවැරදි ව උච්චාරණය කරමින් ශබ්ද නගා කියවීම/ නිවැරදි ව උච්චාරණය කරමින් ශබ්ද නගා හඬ පාලනයෙන් කියවීම/ අවබෝධයෙන් යුතු ව ශබ්ද නගා කියවීම/ විරාම ලක්ෂණවලට අවනත ව කියවීම/ අදාළ ලේඛනවලට උචිත ශෛලිය තෝරාගෙන කියවීම

1. පහත සඳහන් ශ්ලෝකය ශබ්ද නගා කියවන්න.

| | |
|---|---|
| ස්වගෘහේ පූජ්‍යතේ මූර්ඛඃ | මෝඩයා තමාගේ නිවසේ දී පූජා ලබයි. |
| ස්වග්‍රාමේ පූජ්‍යතේ ප්‍රභුඃ | ප්‍රභුවරයා සිය ගමෙහි දී පිදීමට ලක් වේ. |
| ස්වදේශේ පූජ්‍යතේ රාජා | රජතුමා සිය රටෙහි දී පිදීමට ලක් වේ. |
| විද්වාන් සර්වත්‍ර පූජ්‍යතේ | විද්වතා සියලු තැන්හි දී පිදීමට ලක් වේ. |

- පෙළපොතේ ඇති ශ්ලෝක ශබ්ද නගා කියවන්න.

2. පහත සඳහන් කතන්දරය ශබ්ද නගා කියවන්න.

ඔන්න එකෝමත් එක රටක හිටිය යකින්නක්. ඒ යකින්න ළමයින්ට හරිම ආදරෙයි. ඒත් යකින්නක් හින්ද ළමයි නම් හරි බයයි. එක දවසක් ඒ ගමට ආව බිල්ලෙක්. ගමේ හැම දෙනා ම මේ ගැන තමයි කතා කළේ. මෙහෙම ටික දවසක් ගත වුණා. බිල්ලා ගැන කතාවත් නැති වුණා. මේ අතර ගමේ ළමයි එක්කෙනා දෙන්න අතුරු දහන් වුණා. මිනිස්සු හිතුව බිල්ලො ළමයි ඇරන් ගියා කියල. මිනිස්සු ළමයින් ව හැමතැන ම හෙව්ව. මෙහෙම හොයන කොට කැලේ ගල් ගුහාවක ඉඳල ළමයි ටික හම්බුණා. ඒ විතරක් නෙවෙයි. බිල්ලෙකුත් හම්බුණා. වෙලා තියෙන්නෙ මේකයි. බිල්ලො ළමයි ඇරන් යනකොට යකින්න ළමයි ටික බේරගෙන ඉතිරි බිල්ලො ටික කාල. එදායින් පස්සෙ යකින්නට ගමේ හැම දෙනා ම කැමති වුණා.

3. පහත සඳහන් කොටස් සුදුසු විරාම ලක්ෂණ යොදමින් දෙබසක් ලෙස පෙලගස්වා ලියා, ශබ්ද නගා කියවන්න.

ඔන්න ඔහෙ හිටිය පුතේ/ ඔව් ඔව් දැන්මම යමු /අපේ අනික් යාළුවන්ටත් කියමු / ඇයි මේ එළියෙ ඉන්නෙ. වරෙන් ගෙට/ නැන්දේ කෝ නිමල්/ ඒක නෙවෙයි අපි කවද්ද දන්සලේ වැඩ පටන්ගන්නෙ/ එහෙනම් අපි වැඩ පටන් ගමු/ ආ..ං මේ කසුන්නෙ/ ආත නම් කිව්ව හෙට සුබ වැඩවලට හොඳ දවසක් කියල./

**4.** පෙළ පොතේ 155 පිටුවේ රෝස පාටින් අංකිත ඡේද දෙක ශබ්ද නගා කියවන්න. එය පටිගත (Voice Record) කර අසා, හඬනගා කියවීමේ ලක්ෂණ සමඟ සසඳා, අඩුපාඩු ඇතොත් නැවත කියවන්න. (වැඩිහිටියන්ගේ සහාය ලබා ගන්න)

## 7 ශ්‍රේණිය සිංහල
## විරාම ලකුණු නිවැරදි ව හඳුනාගෙන භාවිතා කරමු.

කෙටි ඉර **( - )** ඇල ඉර **( / )** දෙතිත **( : )**

**කෙටි ඉර**

- පද හෝ අදහස් එකට සම්බන්ධ කර දැක්වීමේ දී භාවිතා කරයි.

උදා:- දිව්‍ය - මනුෂ්‍ය වශයෙන් වෙන් වේ.

- කාල පරිච්ඡේද දැක්වීමේ දී

උදා:- බු. ව. 2500 – 2600 දක්වා

- යම් පේළියක වචනයක සම්පූර්ණ අකුරු ප්‍රමාණය ලිවීමට ඉඩ මදි වූ විට

උදා:- සංවර්ධ-
-නය

**ඇල ඉර**

- විකල්ප අවස්ථා දැක්වීම

උදා:- ඔබ වහන්සේට/ඔබතුමාට/ඔබතුමියට ආරාධනා කර සිටිමු.

**දෙතිත**

- සංවාදයක් ලියා දැක්වීමේ දී

උදා:-

කුමරා : අප මේ පැමිණි වන පෙදෙස මුව දඩයමට ඉතා යෙහෙකි ය සොඳුරිය.
කුමරිය: ගමන් විඩාව මිස, ආහාර රුචියක් නොමැත්තේ ය හිමියනි.

- ගණිත ප්‍රකාශනවල අනුපාත දැක්වීම / පැය 24 ඔරලෝසුවේ වෙලාව දැක්වීම

උදා:- 25 සංඛ්‍යාව 2 : 3 අනුපාතයට බෙදන්න.
රැස්වීම පැය 8:30 පැවැත් වේ.

**අභ්‍යාස**

- මෙම ප්‍රශ්න අභ්‍යාස පොතේ පිටපත් කරගෙන පිළිතුරු සපයන්න.

1. ආගමික සංස්කෘතික තොරතුරු සොයා බලයි.
2. සෙල්මුවා ගලින් කරන ලද
3. උත්සවය පෙ ව 9 00 12 00 දක්වා පැවැත්වේ.
4. බැංකුව පැය 8 00 ට විවෘත කෙරේ.
5. පියා තම දරුවන් තිදෙනා අතර 3 4 5 අනුපාතයට දේපළ බෙදුවේ ය.
6. මෙම විරාම ලක්‍ෂණ යෙදුණු අවස්ථා 10 දහයක් (20 පාඩම හැර) සොයා ලියන්න.